# දකුණු ආසියාවේ සාමයික පැවැත්ම හා අන්තර් ප්‍රජා සහයෝගිතාව

**සුදර්ශන් සෙනෙවිරත්න**

**පරිවර්තනය: දයාසිසිර හේවා ගමගේ**

## Inter-cultural coexistence and inter-community cooperation in South Asia

### පූර්විකාව

ශ්‍රී ලාංකිකයකු මෙන් ම ආසියානුවකු, ගෝලීයවැසියකු ලෙස මෙම කතිකාවට පිවිසීමට මම කැමැත්තෙමි. පළමුව කිව යුත්තේ අප මෙවැනි දිවයිනක උපත ලැබීම භාග්‍යයක් බවයි. මක් නිසාද යත් එමගින් පටු කොදෙව් මානසිකත්වයෙන් ඔබ්බට, වෙරළින් එහා සයුරු ඔස්සේ නැණ නුවණ මෙහෙයවා අපේ දැක්ම පුළුල් කර ගත යුතු බවට අපට බල කෙරෙන බැවිනි. එමෙන් ම එමගින් අප බාහිර හා අභ්‍යන්තර සාධක සම්මිශ්‍රණයෙන් ගොඩනැඟුණ, සම්ප්‍රදායෙන් උකහාගත් නූතනත්වයක් ඇති අතිශයින් විචිත්‍ර ප්‍රෞඪ උරුමයක හිමිකරුවන් කර ඇති හෙයිනි.

ANCIENT LANKA

*Ancient Lanka: Volume 4* (2025)
© 2025 by the author/s. https://doi.org/10.29173/anlk946
This is an open access article distributed under the terms and conditions of the Creative Commons Attribution CC BY 4.0

දකුණු ආසියාව මේ වන විට ගෝලීය සංවර්ධනයේ මුව විට අබියස සිටීම හා අනෙක් අතට විවිධ මුලධර්මවාදී සෙවණැලි වැටීමෙන් නොමඟට පිළිපත් විවිධ ත්‍රස්තවාදී සංවිධාන නිසා ව්‍යාකුලත්වයට පත් වූ කලාපයක් වීම අනෙක් වැදගත් කරුණ වෙයි. අපේ ඓතිහාසික දායාදයන් සමාජ සංස්කෘතික පදනම සොබාදහම විසින් ලබා දුන් ද්‍රව්‍යමය ත්‍යාගයන් මෙන් ම යුද්ධයේ ආලාපාළු කිරීම්වලින් ඇද නොවැටී සිටීමට අද අපට ඇති චිරස්ථායී ශක්තිය කලාපයේ අන් රටවල් අබිබවා යයි.

අපේ මව්බිම තවමත් සාර්ක්ෂරතාව, ඒක පුද්ගල ආදායම, සෞඛ්‍ය පහසුකම්, යටිතල පහසුකම්වලින් කලාපයේ අන් රටවලට වඩා ඉදිරියෙන් සිටින බවට අපට උදම් ඇනිය හැකි ය. එම නිසා සාර්ක් කලාපය (SAARC) තුළ වඩාත් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට අපට ඓතිහාසිකවත් භූගෝලීයවත් නියම කර ඇති විටක අප ඒ වගකීම නිහතමානීව භාරගෙන ඉටු කිරීමට අවැසි මාර්ග සිතියම සකස් කර ගෙන කලාපීය එකමුතුව, අභිවෘද්ධිය හා තිරසර සාමය ගොඩනැඟීමට ක්‍රියා කළ යුතු ය.

**නේක වර්ණ දේශ සිත්තම**

ශ්‍රී ලංකාව සාර්ක් කලාපය තුළ භූගෝලීය වශයෙන් වෙන්ව පිහිටි අනන්‍ය, විචිත්‍ර සංස්කෘතියකින් යුතු රටක් යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. අන්තර්ජාතික නාවික මධ්‍යස්ථානයක් ලෙස පිහිටීම නිසා ඈත පෙරදිග, අග්නිදිග ආසියාව, දකුණු ආසියාව, බටහිර ආසියාව, යුරෝපය, නැගෙනහිර අප්‍රිකාව වැනි දේශාන්තර බලපෑම්වලට ලක්වීමෙන් භාෂාමය, ජනවාර්ගික, සංස්කෘතික හා තාක්ෂණික වශයෙන් සම්මිශ්‍රිත ලක්ෂණ සහිත ය. එම නිසා මෙම කුඩා දිවයින එහි භූගෝලීය සීමාවේ ගොඩනඟා ගන්නා සංස්කෘතික පෞරුෂය සාර්ක් කලාපයේ පොදු නියෝජනයක් වෙයි.

පුරාණ ලෝකය තැප්‍රොබේන්, සෙරන්ඩිබ්, සෙයිලෝ හා සිලෝන් වැනි නම්වලින් හඳුනාගෙන සිටි ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ සාර්ක් කලාපය තුළ දකුණු ආසියා උපමහාද්වීපයේ දකුණු අන්තයේ ය. ගුහා හා එළිමහන් තැන්වල විසූ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ පැවැත්ම ක්‍රි.පූ. 30000 තරම් අතීතයට යයි. ඉන්දියානු උපමහාද්වීපයේ තාක්ෂණික සංස්කෘතික විස්තීරණයේ දිගුවක් ලෙස යකඩ තාක්ෂණය හඳුනාගත් ග්‍රාමීය සංස්කෘතිය ක්‍රි.පූ. පළමු සහස්‍රකයේ හඳුනාගනී. වී ඇතුළු භෝග හා සත්ත්ව ගෘහස්ථකරණය ගෘහ කර්මාන්ත ලෝහ භාවිතය මහාශිලා සුසාන භාවිතය මූලික ජනාවාස මෙම සංස්කෘතියේ ලක්ෂණ විය. ක්‍රි.පූ. 4 වන සියවස වන විට එම සංස්කෘතිය දිවයින පුරා ම ව්‍යාප්තව තිබිණ. අනතුරුව එන ඓතිහාසික යුගයේ දී විශාල ආරාමික සංකීර්ණ, අභ්‍යන්තර නාවික නගර, යෝධ ජලාශ හා ජලමාර්ග, සෞන්දර්යයෙන් අනූන උද්‍යාන, ආගමික හා රාජ්‍ය ගොඩනැගිලි, බෞද්ධ හා හින්දු සම්පදායයන්ගෙන් අපට උරුම විය. 13 වන සියවසෙන් පසුව කුළුබඩු වෙළඳාම ඔස්සේ පැමිණි ඉස්ලාමික සම්ප්‍රදායයන් අපගේ

සංස්කෘතියට තුන්වැනි මානයක් එක් කළේ ය. අනතුරුව බටහිර වෙළඳ ප්‍රජාව හා පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලනයන් යටතේ කලාව, වාස්තු විද්‍යාව, සංගීතය, භාෂාව, ආගම, සංස්කෘතිය ආර්ථිකය, දේශපාලන ව්‍යුහය ආදී සෑම අංශයක් තුළට ම සියවස් තුනකට වැඩි කාලයක් තිස්සේ එන්නත් කළ බටහිර ලක්ෂණ නිසා ශ්‍රී ලංකා සමාජය අසල්වැසි අනෙක් දකුණු ආසියානුවන්ගෙන් යම්තාක් දුරකට වෙනස් විශ්වදේශී පෞරුෂයක් සහිත සමාජයක් බවට පරිවර්තනය විය. එම නිසා ලංකා සමාජය සාර්ක් රටවල සංස්කෘතිය හා බද්ධ විය හැකි බහු සංස්කෘතික බහුවාර්ගික අනන්‍යතාවක් එහි අතීතය විසින් උරුම කර දී ඇති අතිශයින් සංවර්ධිත වූවකි.

## දකුණු ආසියාව හඳුනාගැනීම

දකුණු ආසියාව භූගෝලීයව හඳුනා ගන්නේ කෙසේ ද? නූතන සාර්ක් භූ දේශපාලන කඩයිම (ඇෆ්ඝනිස්ථානය ඊට එක් කරන තුරු) යටත් විජිත ගොඩනැඟීමකි. එය 1949ට පෙර බ්‍රිතාන්‍ය පාලනයට නතුව තිබූ ඊට අයත් ආරක්ෂිත රාජ්‍යයන් වූ බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය හා පකිස්ථානය යන රටවලින් සමන්විත විය.

මෙම කලාපීය අනන්‍යතාව තාර්කික දැක්වීමක් ද? යටත් විජිත දැක්වීම පටු අතාර්කික වූවක්ද? අපගේ වසර 3000 කට එහා දිවෙන සංස්කෘතික භූවමාරු රටාව හා මෙම දැක්වීම ගැළපෙන්නේ කෙසේ ද? වඩාත් පුළුල් ඓතිහාසික හා සංස්කෘතික පදනමකින් සාර්ක් කලාපය යලි නිර්වචනය කරගත යුතු වෙයි ද? එමඟින් දකුණු ආසියාව වඩාත් පුළුල් සම්බන්ධීකරණයකින් යුතු කලාපයක් කරගත හැකි ය. දකුණු මැද භූමි කලාපය ආසියානු භූ දර්ශනය තුළ වඩාත් කැපී පෙනෙයි. එහි වඩාත් පැහැදිලි භෞමික සීමාවන් නිසා එයට ම ආවේණික සංස්කෘතික අනන්‍යතාවකින් යුතු ය. එය ඓතිහාසිකව පරිණාමය වූ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන්ගෙන් පොහොසත් ය. හින්දු බෞද්ධ හා ඉස්ලාම් සංස්කෘතික උරුමයන්ගේ තිරස් සබඳතා ඔස්සේ ගොඩනැගුණ ජීවන දර්ශනයන් හා මහා ශිෂ්ටාචාරයක සාඩම්බර හිමිකරුවන් වශයෙන් බහුවිධතාව අගයන පැවැත්මක් තහවුරු වූ කලාපයක් විය.

වෛදික සම්ප්‍රදායයන්ගෙන්, මධ්‍යධරණී හා මධ්‍ය ආසියානු සංස්කෘතීන්ගෙන්, මහායාන බුදුදහමින් පසුව ඉස්ලාම් සම්ප්‍රායයන්ගෙන් පොහොසත් සංස්කෘතියක් උරුම කරගත් ඇෆ්ඝනිස්ථානය අප කලාපය පමණක් නොව ඉන් ඔබ්බෙහි සේද මාවතේ වූ රටවල් ද පෝෂණය කළ රටකි. වෙනත් සාමාජික රටවල් හා සම අයිතිවාසිකම් ඇති රටක් ලෙස ඇෆ්ඝනිස්ථානය සාර්ක් සංවිධානයට පිළිගැනීම යුක්තියුක්ත ය. ඉදින් අපේ සහෝදරත්වයේ උණුසුම් දෑත් දිගුකර නැගෙනහිර කලාපයේ සිටින සහෝදර මියන්මාරය ළං කර නොගන්නේ ඇයි? මියන්මාරවරුන් ද දකුණු ආසියානු ශිෂ්ටාචාරයේ කොටස්කරුවන් ය. ලෝකඩ තාක්ෂණය හා ඇතැම්

විට වී වගාව ද මුලින් ම මෙම කලාපයට පිවිසුණේ ස්වර්ණභූමි හෙවත් මියන්මාරය ඔස්සේ ය. ශ්‍රී ලංකාව වසර දහස් ගණනක් තිස්සේ මියන්මාරය සමඟ සංස්කෘතික සබඳතා පවත්වා ඇත. අප මේ රට එහි සංස්කෘතිය හා ජනතාව සාර්ක් සංවිධානයෙන් ඈත් කර හුදෙකලා කර තබන්නේ කෙසේ ද?

එම නිසා බටහිරින් ඉන්දුකුෂ් උතුරින් පහළ හිමාලය නැගෙනහිරින් අරකන්යොමාව දකුණින් ඉන්දියානු සාගරය සාර්ක් සීමාවන් ලෙස ප්‍රතිනිර්වචනය කළ යුතු ය. එමඟින් පමණක් වසර දහස් ගණනක් තිස්සේ සිදු වූ සංස්කෘතික පෝෂණය පුනර්ජීවනය කළ හැකි ය. එසේ සීමා පුළුල් කිරීමෙන් අපට දේශපාලනිකව හා ආර්ථිකව වඩාත් ශක්තිමත් විය හැකි ය. එම නිසා සාර්ක් සීමා ප්‍රතිනිර්වචනය කර ඒවා පුළුල් කිරීම කාලීන අවශ්‍යතාවක් පමණක් නොව ඓතිහාසික අවශ්‍යතාවක් ද වෙයි.

**ඉන්දියන් සාගර නිම් වළල්ල හා දකුණු ආසියාව**

South Asia and the Indian Ocean Rim (IOR)

ඒ සඳහා ඉන්දියන් සාගර නිම් වළල්ල (IOR) තුළ සාර්ක් කලාපය පුළුල් භෞමික කලාපයක් ලෙස යළි සන්දර්භගත කළ යුතු වෙයි. ඉන්දියන් සාගර නිම් වළල්ලේ (IOR) ඒකීය හැඩගැස්ම අපේ කලාපය තුළ මැනැවින් හඳුනාගෙන නැත. එම ජාත්‍යන්තර සංස්කෘතික හා දේශපාලන සිතියම නැමැති පුළුල් කැන්වසයේ ශ්‍රී ලංකාව පිහිටන ස්ථානය අනුව ඊට සාර්ක් කලාපය තුළ ප්‍රමුඛ වැඩ කොටසක් කළ හැක.

පළමුව කිව යුත්තේ ඉන්දියන් සාගර නිම් වළල්ලේ පිහිටි රටවල් එකිනෙක යා වුණ එක් මාදිලියකින් යුතු මහද්වීපික චන්ද්‍රවංකයක් ලෙස පවතින බවයි. එහි භෞතික ප්‍රවේශයන් නැගෙනහිර අප්‍රිකාවට හා අග්නිදිග ආසියාවට දිගු වෙයි. එනිසා එය ඉතිහාසය මුළුල්ලේ ම භෞමික හා සංස්කෘතික සබඳතා දාමයක් එම කලාප සමඟ පවත්වා ගෙන යමින් අන්‍යෝන්‍යව පෝෂණය වෙයි. ආසියානු කලාපය ලෝක ශිෂ්ටාචාරයට ඉතා වටිනා දේ දායාද කිරීමට සමත් වූයේ මෙමවාස්තවික තත්ත්වයන් උරුම කරගත් හෙයිනි.

වඩාත් ම වැදගත් කරුණ නම් ඉන්දියන් සාගර නිම් වළල්ල ප්‍රධාන ශිෂ්ටාචාර ධාරාවන් දෙකක් හා සම්බන්ධ වන ලෙස පිහිටා තිබීමයි. ශිෂ්ටාචාරයේ මුල් අවධියේ සිට ම මෙම ධාරාවන් දෙක හා පැවැති සබඳතාව තීරණාත්මක ය. ඉන්දියන් සාගරයේ බටහිර නිම් වළල්ල පහළ නයිල් නිම්නය හා මධ්‍යධරණී මුහුදට සම්බන්ධ වී තිබිණ. එහි නැගෙනහිර නිම් වළල්ල චීනයේ මහා භූමි ප්‍රදේශය හා බැඳී තිබිණ.

මෙම අන්තර් සම්බන්ධිකරණ ජාලය හරහා සම්පත් බහුල රටක් වූ ලංකාව පුරාතන ලෝකය හා සම්බන්ධ විය.

**සාර්ක් අනන්‍යතාව**

අපගේ කලාපයේ විවිධ සමාජ ආර්ථික ස්ථරයන්ගෙන් නියෝජනය කරන බිලියන 1.5 ක ජනගහනයක් වෙසෙයි. කත්මන්ඩුහි ප්‍රකාශයට පත් කළ "හිමාල්" 2008 අගෝස්තු කලාපයේ එහි දැක්ම ලෙස සටහන් කර ඇත්තේ "ඉතිහාසයේ පැවැති සාමූහිකත්වය යම් පමණකින් හෝ යළි ගොඩ නගා අපගේ පොදු වාසභූමියේ කිසිදු ගැටුමක් ඇතිවීම වැළැක්වීමට ....." එම නිසා 1985 දී සාර්ක් ගොඩ නැඟීමේ දී පැවැති දේශපාලන එළඹුමෙන් මිදී අපේ සැබෑ සංස්කෘතික කොටස්කරුවන් හඳුනාගත යුතු ය. අපගේ පොදු සංරචකයන් ඔස්සේ ගොඩ නැගෙන එවැනි එකමුතුවක් මගින් මෙම කලාපය පොදු උරුමයන් සහිත ඒකකයක් ලෙස ලෝකයට ඉදිරිපත් කළ හැක. මෙය බී ජී වර්ගෙසේ (B.G. Verghese) නම් මාධ්‍යවේදියා විසින් ඉතා ඥානාන්විත ලෙස
"දකුණු ආසියාව භූගොලීයව පමණක් නොවේ අදහස්, අත්දැකීම්, සංස්කෘතික අන්තර්ක්‍රියාවන්ගෙන්, මධ්‍යස්ථ අභිලාෂයන්ගෙන් අතීතයේ මෙන්ම අනාගතයේත් බැඳී තිබිය යුතුයි" යනුවෙන් අවධාරණය කරයි.

කෙසේ නමුත් ගෝලීයකරණය ක්‍රියාදාමයට ප්‍රවිෂ්ට වන අවස්ථාව වන විට වුව ද අප ජාතික වශයෙන් හා කලාපීය වශයෙන් ගොඩ නැගෙන්නට අසමත් ව සිටියෙමු. පශ්චාද් යටත් විජිත සංදර්භය තුළ දේශපාලන බලය හා සම්පත් පරිශීලනය සඳහා ඇති ගැටුම්කාරී ප්‍රවේශය, අනන්‍යතාව සඳහා වන අරගල ඔස්සේ අපට යන්නට සිදු වූයේ කටුක වේදනාකාරී මාර්ගයකයි. දකුණු ආසියාව කැබලි සමූහයකට බෙදා වෙන් කිරීම යටත් විජිත ව්‍යාපෘතියක් වූ බව රහසක් නොවේ. ව්‍යාජ වාර්ගික අනන්‍යතා ගොඩනගමින් සමාජ විෂමතා ගොඩනැඟීමේ ඔවුන්ගේ ව්‍යාපෘතිය කොතරම් සාර්ථක වූයේ ද යත් පශ්චාද් යටත් විජිත යුගයේ ද වාර්ගික ආන්තිකකරණය වඩාත් තිව්‍ර වෙමින් ආසියානු සමාජය තුළ ධ්‍රැවීකරණයේ විනාශකාරී චණ්ඩ මාරුතය හමා යයි.

තනි ජාතියක හෝ තනි සංස්කෘතියක හුදකලා පැවැත්මක් තිබිය නොහැක. මානව සමාජය ගොඩ නැගෙන්නේ සංස්කෘතික හුවමාරු ක්‍රියාදාමය තුළ ය. විතැන් වූ මානව කණ්ඩායමකට වුව ද හුදෙකලා පැවැත්මක් නැත.

දකුණු ආසියාවේ අප දැන් මුහුණ දෙන ප්‍රධානතම අභියෝගය අනාගත දැක්මක් සහිත සාර්වභෞමික ජාතික, ආගමික අනන්‍යතාවක් ගොඩනගා ගැනීමයි. සාර්ක් රටවල අතීත සහයෝගීතාව ගැන උදම් ඇනීමෙන් සැහීමකට පත් නොවී

පොදු අනාගතයක් සඳහා යාමට ප්‍රදීපාලෝකයක් දැල්විය යුතු ය. අනාගත පරපුරට ප්‍රවිෂ්ට වීමට හැකි සාර්ක් සහයෝගීතා ආත්මීය වාහල්කඩක් තැනිය යුතු ය. එය අවශ්‍යයෙන් ම දකුණු ආසියාවේ භෞතික හා පාරභෞතික උරුමය අමුද්‍රව්‍ය ලෙස භාවිත කර තැනුවක් විය යුතු ය.

සියවස් ගණනාවක් පුරා ම දකුණු ආසියාවේ දියුණු සංස්කෘතික පෞරුෂය ගොඩනැගුණේ සංස්කෘතික අන්තර් සබඳතා තුළිනි. වසර තුන් දහසක පමණ බෙදාහදා ගත් උරුමයකින් පෝෂණය වූ දකුණු ආසියානු රටවල සංස්කෘතියේ සම්භාව්‍ය ප්‍රකාශනවල විවිධත්වය මෙන් ම පොදු ලක්ෂණ ද කැටි ව ඇත. එම නිසා අපේ සංස්කෘතිය අවශ්‍යයෙන් ම අනන්‍ය හා අන්‍යෝන්‍ය ද වේ. දකුණු ආසියානු වැසියන්ගේ බෙදාහදා ගත් සංස්කෘතිය හඳුනාගැනීමට එම අන්‍යෝන්‍ය ලක්ෂණ " උපන් ලකුණක්" වේ.

## උරුමය - ප්‍රතිනිර්වචනය

සහයෝගීතාව සඳහා අවශ්‍ය පදනම සකසන උරුමය දෙසට මෙම සාකච්ඡාව නාභිගත කිරීම අත්‍යවශ්‍ය ය. මෙම කතිකාවත තුළ උරුමය සැලකෙන්නේ බහුමුහුණුවරකින් යුතු උත්ප්‍රේරකයක් ලෙසයි. දකුණු ආසියාවේ සාමයික පැවැත්ම හා අන්තර් ප්‍රජා සහයෝගීතාව සඳහා ප්‍රධානතම වාහකය උරුමය යි. මෙහි දී පූර්ව යටත්විජිත උරුමයේ ස්වභාවය හැදෑරීම අත්‍යවශ්‍ය ය. බහිෂ්කරණය වෙනුවට ස්වීකරණය හඳුනාගත යුතු ය. එමඟින් යටත්විජිත පාලකයන් හා පසුව දේශීය තීරණකාරකයන් විසින් වාර්ගික ආගමික හා දේශපාලනික වශයෙන් ඇති කරන ලද අසමානකම් සමනය කරමින් බිම් මට්ටමේ ප්‍රජාවට එක් විය හැකි ය. උරුමය යන වදන අවබෝධය, බෙදාහදා ගැනීම හා සහයෝගීතාව සඳහා පොදු යාත්‍රාවකි.

උරුමය නිරනුමානව ම මානව පරිකල්පනාවේ අග්‍රඵලය වෙයි. එය ඕනෑ ම සමාජයක ශිෂ්ටසම්පන්න බව හා උසස් සාධන මට්ටමේ පිළිබිඹුවකි. උරුමය තනි හුදකලා අවකාශයක පවතින්නක් නොවේ. එය නොයිඳුල් සංස්කෘතිය පටු සීමා පවුරු අතර නොරඳයි. සංස්කෘතිය, පරිසරය, දැනුම හා මතු පරපුර යන සංඝටක අවශ්‍යයෙන් ම අන්තර්ගත කර උරුමය ගැඹුරු ලෙස ප්‍රතිනිර්වචනය කිරීම අපගේ අභිප්‍රායයි. උරුමය යනු අප උපන් සංස්කෘතියේ අඩංගුව යැයි සරළ ලෙස අර්ථ දැක්වීම ප්‍රමාණවත් නොවේ. සංස්කෘතියේ අඩංගු වන ආහාර පුරුදු, කතාබහ, ඇඳුම් පැළඳුම්, ආගමික විශ්වාස ආදිය අවශ්‍යයෙන් ම හැදුන වැඩුන පරිසරය හා බද්ධව පවතී. අපගේ වර්තමාන සිතිවිලි හා හැසිරීම් හැඩ ගස්වන දැනුම අපට ප්‍රදානය කළ අපේ සංස්කෘතික යටගියාවට සම්බන්ධ සෑම දෙයක් ම පරිසරය හා අවියෝජනීය වේ. එම දැනුමේ සමස්තය "ශිෂ්ටාචාරය" යි. අප එය මතු පරපුරට ප්‍රදානය කරමු.

අනාගතය උදෙසා අපගේ උරුමයේ වටිනාකම් ප්‍රදානය කිරීමේ වගකීම දරමු. එම නිසා උරුමය හුදෙකලාව විකාශනය වූවක් නොවේ. එය සමාන්කර සංස්කෘතීන් හා බෙදාහදා ගනිමින් අන්‍යෝන්‍යව පෝෂණය වූවකි. සමාජයක හැසිරීම, චින්තන රටාව හඳුනා ගැනීමට ඇති හොඳම මෙවලම උරුමය යි. ඒ තුළ එම සමාජවල අභිලාෂයන් හා මාර්ග රටාව සනිටුහන් ව ඇති බැවිනි. වෙනත් තාක්ෂණික සංස්කෘතික කණ්ඩායම් සමග කොතෙකුත් දේ බෙදාහදා ගත්ත ද ඒ ඒ ප්‍රජා කණ්ඩායම්වලට ඒවාටම අයත් (උරුමයේ) පිය සටහන් ඇත. මේ නිසා උත්තරාරෝපණය කරන ඊනියා ගෝලීය සංස්කෘතීන් එම පිය සටහන් මකා දැමීමට නොහැකි ය. ජීවමාන යථාර්ථය එයයි.

**සම්භාවනීය ආසියාවක සමාදාන සහජීවනය**

දකුණු ආසියානු සංස්කෘතීන් විකාශනය වී ඇත්තේ ආතතිය හා ප්‍රකම්පනය සමනය කරන හා ඒවායෙන් මිදෙන යාන්ත්‍රණයන් ඒ තුළට කා වද්දමිනි. අන්තර් ප්‍රජා සම්බන්ධතා පුනරූපණය කරන මුල්ම දෘෂ්ටාන්තයක් අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙයි. ඒ අනුව මිනිස් සබඳතාවල දී පැන නගින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රජා සම්මතයෙන් මහාසම්මත කෙනෙකු පත් කර ගනී. මහාසම්මතගෙන් බලාපොරොත්තු වූයේ ධාර්මිකව සාමය හා සංහිඳියාව පවත්වා ගෙන යාමයි. වඩාත් සංවිධිත රාජ්‍ය බිහිවීමෙන් පසු රාජ්‍යය අධිරාජ්‍ය දක්වා වර්ධනය වන විට බෞද්ධ මූලාශ්‍රය විශ්ව රාජ්‍ය සංකල්පය හෙවත් චක්කවත්ති රාජ්‍ය සංකල්පය ඉදිරිපත් කරයි. චක්කවත්තිසීහනාද සූත්‍රය හා මහාසුදස්සන සූත්‍රය දක්වන්නේ සකිවිති රජු නිරූපණය කරන්නේ ජනයාගේ ජීවන තත්ත්වය නැංවීමේ වගකීම දරණ සමස්ත පරිසරයට ම වග කියන අයකු ලෙසටයි. දසරාජ ධර්මය අනුව සිය පාලන කටයුතු කිරීමට රජු එකඟතාව පළ කරයි. මේ නිසා වැසියා හා සමාජය පාලනයට කොටස් කාරයකු වෙයි. මෙය ප්‍රකට බෞද්ධ ගාථාවකට අනුව,

| | |
|---|---|
| දෙවො වස්සතු කාලෙන | කලට වැසි වසීවා! |
| සස්ස සම්පත්ති හෙතු ච | කෙත්වතු සාර වේවා! |
| පීතො භවතු ලොකො ච | ලොව සසිරි වේවා! |
| රාජා භවතු ධම්මිකො | නරපති දැහැමි වේවා! |

සිද්ධාර්ථ ගෞතමයන් ප්‍රජා සම්බන්ධීකරණය සඳහා භික්ෂු, සංඝ හෝ ගණ යන නම් වලින් හඳුන්වන ලද පිරිසකගෙන් සමන්විත ආයතනයක් බිහි කිරීම ජනතා හිතකාමී ව්‍යාපෘතියක් විය. එහි දී කණ්ඩායම් ජීවිතයේ දී පැන නගින ගැටලු සමථයකට පත් කර ගැනීම සඳහා විනය මාලාවක් ද හඳුන්වා දෙන ලදි. බහුජන

හිතසුව පිණිස කටයුතු කරන ලෙස ඔවුනට උපදෙස් දීම ප්‍රජා සබඳතාවල වැදගත්කම තීව්‍ර කරයි.

## ගැටුම් අවම කර ගැනීම

සමාජ ජීවිතයේ දී ගැටුම් අවම කර ගැනීම සඳහා පුද්ගලික මට්ටමින් පිළිපැදිය යුතු ආචාරධර්ම ඉදිරිපත් කරයි.

පරපණ නොනැසීම, නොදුන් දෙය නොගැනීම, අනාචාරයේ නොහැසිරීම, අසත්‍ය ප්‍රකාශයෙන් වැළකීම, මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොරවීම යන පංචශීල ප්‍රතිපත්තිය හිතකර සමාජය වාතාවරණයකට අවැසි මූලික ආචාර ධර්ම වෙයි. සිඟාලෝවාද පරාභව, ධම්මික, මහාමංගල වැනි සූත්‍රවල පවුල, සමාජය, සේවකයන් හා වහලුන්, ගුරුවරුන්, පූජ්‍යයන් හා රාජ්‍යයට ද එකිනෙකාට යුතුකම් එකිනෙකාගේ අයිතිවාසිකම් සහිතව ආචාර ධර්ම ඉදිරිපත් කරයි. මහාපරිනිර්වාණ සූත්‍රයේ ඉදිරිපත් කරන සප්ත අපරිහානීය ධර්ම ආතතිය හා ප්‍රකම්පනය අවම කර ගනිමින් එකමුතුකමින් සමගි සම්පන්න බවින් යුතුව කටයුතු කිරීමට ඇති අගනා ම මාර්ගෝපදේශ වෙයි. වෛශාලියේ ලිච්ඡවීන් හට බුදුන් වහන්සේ අනුදන වදාළේ, සමගිව රැස්වන්න, සමගිව නැගී සිටින්න, කාලීනව වැදගත් සම්ප්‍රදායයන් රකින්න, වැඩිහිටියනට ගරු කරන්න, කාන්තාවනට ගරුකරන්න යනුවෙනි. මේ කරුණු නොකඩවා පිළිපැදීම නිසා එක්සත්ව අභිවෘද්ධිය කරා යන බව පෙන්වා දී ඇත. මෙම ධර්මෝපදේශ ඇසුරින් විශේෂයෙන් බුදුදහමේ මග පෙන්වීම අනුව අශෝක විසින් අශෝක දහම යැයි අද අප හඳුන්වන මාර්ගෝපදේශ සංග්‍රහය සකසන ලදි.

## දකුණු ආසියා සහයෝගීතාවේ නූතන මුහුණුවර

පශ්චාද් යටත් විජිත පරපුරේ අය දකුණු ආසියානු සමාජය භාෂාව ආගම ජනවර්ගය පදනම් කර ගත් වෙන් වූ අනන්‍යතා සහිත ඒකක ලෙස හඳුනාගැනීමට ප්‍රයත්න දැරීම අරුමයක් නොවේ. එය ඓතිහාසික ව විකාශනය වූ තත්ත්වයක් ය යන්න ඔවුන්ගේ විශ්වාසය යි. ඉතා පැහැදිලිව ම මෙම යුගයේ ප්‍රමුඛ ලක්ෂණ වනුයේ ආර්ථික ස්වාධිකාරයෙන් යුතු වාර්ගික පදනමෙන් යුතු මානව සංස්කෘතික ඒකක ගොඩනගා ගැනීමට දරන ව්‍යායාමය යි. බාහිරින් ගෝලීයකරණ ක්‍රියාදාමය සිදුවෙද්දී අභ්‍යන්තරයේ සිදුවන්නේ ඊට ප්‍රතිවිරුද්ධව සමාජ පැසිස්ට්වාදය ක්‍රියාත්මක වෙමින් විකල්ප පාලන ක්‍රම සඳහා වෙන්ව යාම වෙත තල්ලු වීමයි. මෙමගින් ඉතා පැහැදිලිව ඉඟි කරන්නේ ජාතිවාදී, ආගම්වාදී, භාෂාවාදී ප්‍රවණතා යටපත් කිරීමට ගෝලීයකරණයට නොහැකි වී ඇති බවයි. මෙම සන්දර්භය තුළ වටහා ගත යුතු දෙය නම් වෙන ම අනන්‍යතා ගොඩනැඟීමට දරන ප්‍රයත්නයන් වෙන ම සමාජ

දේශපාලන බල ව්‍යාපෘති වන බවයි. මෙය දකුණු ආසියා සහයෝගීතාවේ අද පවතින ඛේදනීය මුහුණුවරයි.

දකුණු ආසියාවේ සංස්කෘතික භූ දර්ශනය තුළ අවශ්‍යයෙන් ම දිස්වන්නේ බහු සංස්කෘතික හා බහුවාර්ගික අනන්‍යතාවන් ය. නූතන ආසියාවේ වෙන්ව පෙනෙන මෙම ජනවර්ග භාෂා ආගම් හා ආගමික - සංස්කෘතික විවිධතාවල සාධාරණ සංස්කෘතික ලක්ෂණවලින් ආසියාවට ම සාධාරණ වූ සංස්කෘතික රටාවක් මතු කර ගත හැකි ය. වැදගත් ම ප්‍රශ්නය නම් අනෙකුත් සංස්කෘතීන්ට ගරු කිරීමට ඒවා පිළිගැනීමට අප කොතෙක් දුරට සූදානම් ද? යන්නයි.

සංස්කෘතික අනන්‍යතා හා සංස්කෘතික විවිධත්ව සහිත ප්‍රජාවන් අතර පවතින සබඳතාවල යථා තත්ත්වය එසේ ය. මෙම සංස්කෘතික අවකාශයන් ගෝලීයකරණය තුළට සංකෝචනය කිරීමට නම් පවතින පටු මනෝභාවයන් කාලය, අවකාශය හා සංස්කෘතික විශේෂණයන් වශයෙන් විභජනය කර පුබ්බේනිවාසානුස්සතියෙන් බැලිය යුතු ය. දකුණු ආසියාව සංස්කෘතික විවිධත්වයෙන් බහුසංස්කෘතික ලක්ෂණයන්ගෙන් උද්දීපනය වී ඇති ආකාරය දැකීමට නම් තනි රටක් තනි සංස්කෘතියක් යන මනෝභාවයෙන් ඉවත් වී නිවැරදි දිශාභිමුඛව සිට ගත යුතු ය. කලාපාන්තරව දේශාන්තරව බෙදාහදා ගත් සංස්කෘතික දිගන්තයන් දිස්වන්නේ එවිට ය.

## ශ්‍රී ලංකාව අභිසරණ කේන්ද්‍රයක් ලෙස

අපගේ භූගෝලීය පිහිටීම අප වෙත ප්‍රදානය කරන සුවිශේෂී වාසිය ශ්‍රී ලංකාව විවිධ දේශපාලන, සමාජ, ආර්ථික, හා ආගමික කණ්ඩායම්වලට අභිසරණ (ඒකරාශී) කේන්ද්‍රයක් වීමයි. ඉතා ඈත අවධියේ සිට ම එවැනි පිරිස් වෙත හා පුද්ගලයන් වෙත මේ දිවයින ක්ෂේම භූමියක් විය. එමගින් දිවයින අන්තරාලයක් (වෙළඳ හුවමාරු පලක්) විය. ක්‍රි.පූ. 4 වන සියවසේ සිට ම ඉන්දියානු සාගරයේ සංස්කෘතික හා ආර්ථික මර්මස්ථානය විය.

ඉන්දියන් සාගර නිම් වළල්ල තුළ අපගේ ඓතිහාසික කාර්යභාරය පුනර්ජීවනය කරන්නේ කෙසේ ද? මෙහි දී ආසියානු සංවිධානය තුළ සිංගප්පූරුවේ අත්දැකීම් සැලකිල්ලට ගනිමු. සිංගප්පූරුව "ආසියා මැද පෙරදිග සංවාදය"(AMED) සඳහා පහසුකම් සපයන්නාගේ කාර්යය භාර ගෙන නොබෝ කලකින් ම එම කාර්යභාරය තුළ මර්මස්ථානයක් බවට පත් විය. ශ්‍රී ලකාවට ඉන්දියන් සාගර නිම් වළල්ල (IOR) තුළ සමාන වගකීමක් දැරිය නොහැකි ද? උගතුන් හා වෘත්තීය ව නිපුණ අය ලෙස අපි අපේ දායකත්වය දෙමින් මෙම කලාපයේ උරුම කළමනාකරණයට ඵලදායී ලෙස හා මධ්‍යස්ථ ලෙස අපට මැදිහත් විය හැකි බව

පෙන්වා දී ඇත්තෙමු. මෙම කාර්යභාරය සඳහා කලාපයේ අනෙකුත් රටවලට යම් යම් බාධා ඇත. සාර්ක් කලාපය තුළ වෙනත් සංවිධානවල කාර්යභාරයන් සඳහා ද මෙමගින් පහසුකම් සැපයිය හැකි ය.

ශ්‍රී ලංකාව ස්වාධීන හා අපක්ෂපාතී මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව තුළ භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් කිරීම, වරාය පහසුකම් වර්ධනය කිරීම, නැව් තැනීම හා අලුත් වැඩියා කිරීම, ගුවන් හුවමාරු පහසුකම් වර්ධනය කිරීම සම්මන්ත්‍රණ හා සමුළු පහසුකම් සැපයීම වැනි ක්‍රියාමාර්ග වෙත යොමු විය හැකි ය. ඊට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් හා විනෝදාස්වාදය සැපයීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට පත් වීමට අපට ඇති ශක්තිය ඉහළ ය. ගාල්ලේ පැවැත්වෙන සාහිත්‍ය හා සංස්කෘතික උත්සව මෙවැනි කාර්යයන්ට අපට අතගැසිය හැකි බව පෙන්වන සුළු නිදර්ශනයකි. මෙවැනි උත්සව වඩාත් සංවිධානාත්මකව පුළුල් ලෙස කළ හැකි ය.

## උරුම සබඳතාව තෙවන මානයක් ලෙසින්

අභිසරණ කේන්ද්‍රයක් ලෙස සංවර්ධනයේ දී ඉහත ක්‍රියාවලිය හා බද්ධ වෙමින් පළ ප්‍රයෝජන ගත හැකි අපට ඇති වඩාත් ම ධනාත්මක සාධකය නම් SAARC හා IOR රටවල් බද්ධ කළ හැකි අපගේ බහු සංස්කෘතික අනන්‍යතාවයයි. අප සතුව පහත සඳහන් වාසිදායක තත්ත්වයන් ඇත.

- පොදු සංස්කෘතියක්
- සංස්කෘතික විවිධත්වය
- බහු සංස්කෘතික ලක්ෂණ
- සංස්කෘතික අනන්‍ය ලක්ෂණ

බෞද්ධ, හින්දු, ඉස්ලාමික, ක්‍රිස්තියානි වැනි ආගමික සංස්කෘතීන් ගණනාවක සම්මිශ්‍රණයකින් සැකසුණ ප්‍රජාවක් මෙරට වෙසෙති. ඉන්දියාව හැරුණ විට මෙවැනි වාසියක් කලාපය තුළ ඇත්තේ අපට පමණි. බුදුදහම ඔස්සේ කලාපයේ අන් රටවල් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනැඟී තිබිණ. දඹදිව වන්දනා ගමන්, මහාබෝධි සමාගම, බෞද්ධ පරම විඥානාර්ථ සමාගම, අම්බෙට්කර් සමාගම - මේ සැම එකකින් ම නිරූපණය කරන්නේ සහසම්බන්ධය යි. එමෙන් ම බංගල්දේශ්හි බෞද්ධයන් පකිස්ථානයේ ගන්ධාර බෞද්ධ ස්ථාන ඉතා ඉක්මණින් මෙම සහසම්බන්ධතා මාර්ග සිතියම හා එක්වනු ඇත. රාමායනය හා බැඳුන ශ්‍රී ලංකාවේ ස්ථාන, කෝනේශ්වරම, තිරුකිතේශ්වරම්, මුන්නේශ්වරම්, කතරගම හා ශ්‍රී පාදය සහසම්බන්ධතා සඳහා යොදා ගත හැකි ඉතා වැදගත් බහු සංස්කෘතික ස්ථාන වෙයි. බෞද්ධ-හින්දු, ක්‍රිස්තියානි-ඉස්ලාමික වශයෙන් අපේ උරුමයන් හඳුන්වා දීමට දරන

උත්සාහය නිසා අනෙක් SAARC හා IOR රටවල් හා එම ජනයා සමඟ සබඳතා වර්ධනය කර ගත හැකි ය.

අතීතයෙන් අපට දායාද කර ඇති මෙම ප්‍රෞඪ සංස්කෘතික උරුමයන් රැක ගැනීමේ වගකීම කලාපයට ඇත. එය කලාපාන්තර සංස්කෘතික සබඳතා ජීවමාන කරන, සාර්ක් රටවල ආත්මීය තිරසාර ලක්ෂණ රැකෙන, සම්ප්‍රදාය හා නවීනත්වය මුසුවන ලෙස කළ යුතු ය. මෙම කරුණු සංක්ෂේප කර සුභවාදීව බලන විට මට වැටහෙන්නේ ප්‍රාදේශීයවාදය නමැති අන්ධකාර ආගාධයෙන් මිදී සහසම්බන්ධතා යුක්ත සංස්කෘතික හුවමාරු ඇති ක්ෂේම භූමි වෙත පිවිසීමට අපේ කලාපයේ ජනතාවට නැණ නුවණ ඇති බවයි. දකුණු ආසියානුවන් වශයෙන් අපට පොදු සංස්කෘතියක කොටස්කරුවන් වීමට කාලය හා අවකාශය මගින් මං පෙත් ගණනාවක් ම විවෘත කර ඇත. ස්වාභාවික පිහිටි මං පෙත් පමණක් නොව මෙම කලාපයේ බිහි වූ ඉතා අගනා සමාජ දර්ශනයන් ගණනාවක් ම ඒ සඳහා මං පෙත් සකසා දී ඇත. දේශීයව ගොඩනගා ගත් සමාජ අගයයන් මෙන් ම බෙදාහදාගත් අගයයන් ඇත. එහෙත් ඒවා මැකී යමින් පවතී. සාමය පණිවුඩයක් ලෙස පමණක් නොව ප්‍රායෝගිකව මේ කලාපයේ ම ඉපදී වසර දහස් ගණනක් හැදී වැඩුණු ජීවන දහමක් බව චිත්‍ර මූර්ති කැටයම් හා සාහිත්‍යය සාක්ෂ්‍ය දරයි. මෙම ආත්මීය හා සංස්කෘතික බැඳීම ඉතා ඉහළ මට්ටමක පැවතිණ. අන්‍යෝන්‍ය පැවැත්මට ඉවහල් වූ බෙදාහදාගත් සංස්කෘතික උරුමයක ආශ්වාදය විඳින අතර ම දකුණු ආසියාව තුළ ශ්‍රී ලංකාවේ කාර්යභාරය යළි සලකා බැලීමට මෙය ප්‍රවේශයක් වේ වා!

රවීන්ද්‍රනාත් තාගෝර්ගේ "දිව්‍යමය නිදහස" කාව්‍යයෙන් මගේ පැතුම නිමා කරන්නට අවසර.

*''බියෙන් තොරව හිස කෙළින් තබා ගෙන සිටිනට හැකි*
*ඥානය නිවහල් වූ*
*පටු පවුරු වළලුවලින් නොබෙදුන*
*සැබෑ වදන් පමණක් සවනට එන*
*සරතස නැති*
*අත් වෙර ලා දුනු ඇද සාර දෙය ම නෙලන*
*නිසරු දේ නම් මරු කතර වැද පෑදි දිය දහර නොසිඳෙන*
*දිගු දැක්මකින් අනාගතය වෙත යන*
*නිදහස් ස්වර්ග රාජ්‍යයකට*
*මාගේ දේශය අවදි කරනු මැන පියාණනි! ''*

Translation from English: Dayasisira Hewa Gamage
Editorial review: Kanishka Wijayarathna